# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/188/2020 (NPC)**

කේ.එම්.ජේ.කේ.බණ්ඩාර
**අභියාචක**

**එදිරිව,**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.03.24**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

කෝණාර මුදියන්සේලාගේ ජගත් කෝසල බණ්ඩාර යන අය විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2020.11.10 දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (උතුරු දිසාව) විසින් ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය අවලංගු කර ඔහු වෙත පනවා ඇති දඬුවම බල රහිත කරන ලෙසයි. ඉහත කී දඬුවම, උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් අභියාචකට එරෙහිව නිකුත් කර ඇත්තේ, ඔහු විසින් අත්සන් තබන ලද 2018.12.10 දිනැති ලිපිය මඟිනි. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා දෙකට ඔහුව වැරදිකරු කරමින්, අභියාචකගේ වැටුප් වර්ධකයක් වසරක කාලයකට විලම්භනය කිරීමට නියෝග කර ඇත.

එකී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම කොමිෂන් සභාව විසින් ඉහත කී අභියාචනය සළකා බලා විනය නියෝගයේ සඳහන් පළමු දඬුවම එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමක් ලෙසට සංශෝධනය කිරීමටත්, ඊට අමතරව වැඩ හා හැසිරීම් ගොනුවක් වසර පහක් දක්වා පවත්වාගෙන යාමටත් තීරණය කර ඇත. ඒ අනුව මෙම විනිශ්චය අධිකාරය විසින් තීරණය කළ යුතු වන්නේ, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2020.10.12 දරන ලිපිය මඟින් අභියාචක වෙත නිකුත් කර ඇති විනය දඬුවම නිවැරදිද යන්න සහ එම දඬුවම නිකුත් කිරීම සඳහා උපයෝගී කර ගෙන ඇති විනය පරීක්ෂණයෙන් පසු ගනු ලැබූ තීරණය නිවැරදිද යන්නයි.

අභියාචකට එරෙහිව වූ විනය පරීක්ෂණය පවත්වා ඇත්තේ, ඔහුට විරුද්ධව 2017.09.07 දින නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා මතය. එකී චෝදනා වන්නේ, පොලිස් නියෝග ඒ 07(බී) පරිශිෂ්ඨයේ සඳහන් විනය නීති සංග්‍රහයේ 1 වගන්තිය සහ (2ජී) වගන්තිය යටතේ වන චෝදනාවන්ය. එම චෝදනා දෙකටම පදනම් වී ඇත්තේ, අභියාචක මරදාන පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී, 2015.05.08 දින හෝ ඊට ආසන්න දිනකදී, පෙරුමනායගම් සුබ්‍රමනියම් යන අයට අයත් අංක WP UI 2787 දරන යතුරුපැදිය සොරා ගැනීම සහ එම යතුරු පැදිය ඔහු සන්තකයේ තබා ගැනිමයි.

ඉහත කී චෝදනා ඔප්පු කිරීම සඳහා පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සාක්ෂි සළකා බලන ලදී. විධිමත් විනය පරීක්ෂණයේදී පෙරුමනායගම් සුබ්‍රමනියම් යන අය සාක්ෂි දෙමින් එකී WP UI 2787 දරන යතුරු පැදියේ හිමිකරු ඔහු බවට ප්‍රකාශ කර ඇත. ඒ සමඟම විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත්ව තිබූ සාක්ෂිවල සඳහන් නිරෝෂන් පුෂ්පකුමාර නැමැති අය ප්‍රකාශ කර ඇත්තේ, මෙම කරුණට අදාළ යතුරු පැදිය අලුත්වැඩියා කර ගැනීම සඳහා අභියාචක විසින් යතුරු පැදිය ඔහු වෙත භාර දුන් බවයි. එම සාක්ෂි බිඳ හෙලී නැත. ඒ අනුව එම සාක්ෂි පිළිගත යුතු වේ.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් අභියාචකට එරෙහිව පැවති කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශයට පත්කර ඇති 2019.09.05 දිනැති තීන්දුවේ සඳහන්

කරුණුය. එම තීන්දුව ප්‍රකාශයට පත් කර ඇත්තේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ සොරකම සහ සොර බඩු ලඟ තබා ගැනීම යන චෝදනා යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් දෙක සිදු කර ඇතැයි කියනු ලබන චෝදනා දෙක සම්බන්ධයෙනි. එම නඩු තීන්දුවේ පිටපතක් අභියාචක විසින්ම මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත. එම නඩුව මෙම සිද්ධියට අදාළවම පවරා තිබූ නිසා එහිදී සටහන් කර ඇති සාක්ෂි මෙම අභියාචනය සම්බන්ධයෙන් ද සළකා බැලීමෙන්, මෙම අභියාචනය සම්බන්ධයෙන් නිවැරදි තීරණයකට එළඹීමට හැකි වනවා ඇත.

ඉහත කී මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු තීන්දුවට අනුවද මෙම කරුණට විෂය වස්තුව වූ යතුරු පැදිය සුබ්‍රමනියම් යන අය සතු වූ බවට සාක්ෂි ඉදිරිපත් වේ. මේ සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී ද එය එසේම වන්නේය. අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති දෙවන සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ, ඔහු ලොරි රථයක රියදුරු වශයෙන් කටයුතු කරන බවත්, අභියාචක විසින් 2015.05.08 දින යතුරු පැදියක් අලුත්වැඩියා කිරීම සඳහා ගෙන යාමට අවශ්‍ය බවට ඔහුට දැනුම් දුන් බවත්ය. එම යතුරු පැදි අංකය WP UI 2787 බව ඔහු විසින් පැහැදිළිව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී අභියාචක පොලිස් නිළ ඇඳුමින් සැරසී සිටි බවටද ඔහු විසින් වැඩිදුරටත් පවසා ඇත. ඊට අමතරව අධිකණයේ සාක්ෂි දෙන ලද තුන්වන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, ඉහත කී යතුරු පැදිය අභියාචක විසින් ලොරි රථයකින් ගෙනැවිත්, එහි යතුර ඔහු වෙත ලබා දුන් බවයි. ඒ අවස්ථාවේදීද අභියාචක නිළ ඇඳුමින් සැරසී සිට ඇති බවටද එම සාක්ෂිකරු සඳහන් කර ඇත.

ඉහත කී සාක්ෂි විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වූ සාක්ෂි හා ගැලපෙනවා ඇත. අධිකරණය විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා වලින් ඔහුව නිදහස් කර ඇතත්, ඉහත කී සාක්ෂිකරුවන් ලබා දී ඇති සාක්ෂි, එම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවට එම තීන්දුවේ සඳහන්ව නැත. නඩු තීන්දුවට අනුව, අභියාචක එම නඩුවෙන් නිදහස් වී ඇත්තේ, නඩු භාණ්ඩ පොලිස් භාරයට ගැනීම සම්බන්ධයෙන්, සාධාරණ සැකයක් ඇති වීම හේතුවෙනි.

ඉහත කී කරුණු සියල්ලම සළකා බැලීමෙන් පෙනී යන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා සම්බන්ධයෙන් ඔහුව වැරදිකරු බවට පත් කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත්ව තිබූ බවයි. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව ගෙන ඇති තීරණයේ දෝෂයක් පෙනෙන්නට නැත.

ඉහත කී ආකාරයට අභියාචකට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනාවන්ට ඔහු වැරදිකරු බවට පත් කිරීම හේතුවෙන්, නිකුත් කර ඇති විනය නියෝගය මඟින් ඔහුගේ එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමටත්, වැඩ සහ හැසිරීම් ගොනුවක් වසර පහක් දක්වා පවත්වාගෙන යාමටත් ගෙන ඇති තීරණය, අභියාචක වරදකරු බවට පත් කර ඇති චෝදනා සළකා බලන විට අධික හෝ බරපතල දඬුවමක් නොවන බව, පෙනී යයි. ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/